# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,467 - 2025 දෙසැම්බර් මස 12 වැනි සිකුරාදා - 2025.12.12

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී. )


## II කොටස - අධිකරණ

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත. )


| | පිටුව |
|---|---|
| සම්මත වූ පනත් ... ... | — |
| පනත් කෙටුම්පත් ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන්වීම් ... ... | — |
| ශ්‍රී ලංකා ඇපැල් උසාවියේ දැන්වීම් ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන ... ... | — |
| දිසා අධිකරණ හා මහෙස්ත්‍රාත් අධිකරණ දැන්වීම් ... ... | — |
| වස්තු භංගත්ව නඩු පිළිබඳ දැන්වීම් ... ... | — |
| පිස්කල් මාර්ෂල්වරුන්ගේ පත් කිරීම් ... ... | — |
| පිස්කල් විකිණීම් ... ... | — |
| බූදල් නඩු පිළිබඳ දැන්වීම් ... ... | — |
| නීති අධ්‍යාපන සභාවේ දැන්වීම් ... ... | — |
| නොතාරිස් ලැයිස්තුව ... ... | — |
| විවිධ දැන්වීම් ... ... | 430 |


### සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2026 ජනවාරි මස 02 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2025 දෙසැම්බර් මස 19 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපැලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය

"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය. "

2025 ජුනි මස 09 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

**එස්. ඩී. පාඩිකෝරාල,**
රජයේ මුද්‍රණාලයාධිපති (*වැ. බ.* )

මෙම *ගැසට් පත්‍රය* www. documents. gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# නොතාරිස් ලැයිස්තුව

**රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය**

මගේ අංකය : HA/05/20/01/01/35.

107 අධිකාරයේ නොතාරිස් ආඥාපනතේ 23(1) වගන්තිය යටතේ නිකුත් කරනු ලබන දැන්වීම

පහත උපලේඛනයේ සඳහන් නොතාරිස්වරුන් විසින් එක් එක් නොතාරිස්වරයාගේ නම ඉදිරියෙන් දක්වා ඇති දින සිට ක්‍රියාත්මකවන පරිදි නොතාරිස් ධුරයෙන් ඉල්ලා අස්වීම පිණිස කරන ලද ඉල්ලීම ගරු රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමා විසින් බාරගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

| | *නොතාරිස්වරයාගේ නම* | *කටයුතු කිරීමට බලයලත් අධිකරණ කලාපය* | *නොතාරිස් කටයුතු සිදුකළ භාෂාව/භාෂාවන්* | *නොතාරිස් ධුරයෙන් ඉල්ලා අස්වූ දිනය* |
|---|---|---|---|---|
| 1 | පලිහපිටිය ගමගේ සිරිල් ඩයස් මහතා | තංගල්ල | සිංහල | 2025.03.21 |
| 2 | සුජාතා විජයලක්ෂ්මී ලියනගේ මිය | කොළඹ | සිංහල | 2025.03.31 |
| 3 | ජයසුන්දර මුදියන්සේලාගේ දයාරත්න බණ්ඩා ජයසුන්දර මහතා | කුරුණෑගල | සිංහල | 2024.11.01 |
| 4 | උඩගේ කංකානම්ගේ දොන් කෝෂිත හිමාල් උඩගේ මහතා | පානදුර | ඉංග්‍රීසි හා සිංහල | 2025.03.28 |
| 5 | ප්‍රසංජීව පට්ටිආරච්චි මහතා | පානදුර | ඉංග්‍රීසි හා සිංහල | 2024.03.01 |

ගරු අමාත්‍යතුමාගේ නියමය පරිදි,

එස්. ආලෝක බණ්ඩාර,
ලේකම්,
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය.

2025 නොවැම්බර් මස 20 වැනි දින,
කොළඹ දී ය.

12-154

# විවිධ දැන්වීම්

**ස්වකීය සිවිල් අධිකරණ බලය ක්‍රියාත්මක කරමින් (කොළඹ දී පවත්වනු ලබන) බස්නාහිර පළාතේ මහාධිකරණයේ දී ය.**

*නඩු අංකය* : CHC/61/2025/CO.
*ස්වභාවය* : ගණන් බේරා වසා දැමීම
*කාර්ය පටිපාටිය* : ලඝු

අහංගම, ප්‍රේමා වෙල්හේන්ගොඩ දරන ස්ථානයේ ලියාපදිංචි කාර්යාලය පිහිටි අංක (PV 00213124) දරන ස්කොබ් (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගම සමාගම් ගණන් බේරා වසා දැමීමේ රීති සමග කියවිය යුතු (සංශෝධිත) 2007 අංක 7 දරන සමාගම් පනතේ XII කොටසේ 270 වගන්තිය යටතේ සහ එය ප්‍රකාරව අධිකරණය විසින් ගණන් බේරා වසා දැමීම සඳහා වූ ඉල්ලීමක් පිළිබඳ කාරණයේ දී ය.

සමත් තේජාන් ගම්මම්පිල,
අංක 53/1,
පෙරේරා මාවත,
කොහුවල.

...............*පෙත්සම්කරු.*

*එදිරිව*

රවී ඩයස් බණ්ඩාරනායක,
අංක 24, ගවර් වීදිය,
කොළඹ 05.

............*වගඋත්තරකරු.*

ඉහත නම් සඳහන් සමාගම ගණන් හිලවු බේරා වසා දැමීම සඳහා සිය සිවිල් අධිකරණ බලය ක්‍රියාත්මක කරමින් කොළඹ දී පවත්වනු ලබන බස්නාහිර පළාතේ මහාධිකරණය වෙත 2025 ඔක්තෝබර් 17 දින පෙත්සමක් ඉදිරිපත් කරන ලද බවත්, එම පෙත්සම 2026 ජනවාරි මස 13 දින අධිකරණය ඉදිරියේ දී ඇසීමට නියම කර ඇති බවත් මෙයින් නිවේදනය කරනු ලැබේ. එම පෙත්සම පිළිබඳව නියෝගයක් ලබාදීමට කැමති හෝ ඊට විරුද්ධ වන ඕනෑම ණය හිමියෙකුට හෝ එකී සමාගමෙහි දායකයකුට නඩුව කැඳවන අවස්ථාවේ දී පුද්ගලිකව හෝ සිය නීතිඥවරයා මාර්ගයෙන් පෙනී සිටිය හැකි අතර, පෙත්සමෙහි පිටපතක් එය අවශ්‍ය කෙරෙන ඕනෑම ණය හිමියෙකුට හෝ එකී සමාගමෙහි දායකයෙකු වෙත ඒ සඳහා වන නියමිත ගාස්තු ගෙවීමෙන් පසුව පහත අත්සන් තබා ඇති අය විසින් ලබාදෙනු ඇත.

අත්සන් කළේ : ඒ. ඩී. ශ්‍යාමලී අයි. අතුකෝරල,
පෙත්සම්කරුගේ නීතිඥ,
අංක 166/1, අලුත්කඩේ වීදිය, කොළඹ 12.

*සටහන.-* එකී පෙත්සම අඬගසනු ලබන අවස්ථාවට පෙනී සිටීමට කැමැත්තක් දක්වන ඕනෑම පුද්ගලයෙකුට ඔහු එසේ කැමැත්තෙන් සිටින බව ඉහත නම් සඳහන් පෙත්සම්කරුගේ නීතිඥවරයා වෙත ලිඛිතව තැපෑලෙන් දැන්විය යුතුය. *නැතහොත්* ගෙනැවිත් භාරදිය යුතුය. එම නිවේදනයෙහි පුද්ගලයාගේ නම ලිපිනය සහතික කළ යුතුය. එසේ නැතහොත් තම නීතිඥවරයා (සිටී නම්) මාර්ගයෙන් භාරදිය යුතුය. තැපෑලෙන් එවනු ලබන්නේ නම් 2026 ජනවාරි මස 12 වැනි දින පස්වරු 6.00 ට පෙර ඉහත නම් සඳහන් අය වෙත ලැබෙන පරිදි එවිය යුතුය.

12 - 160

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.